# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1995/27 - 2016 දෙසැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2016.12.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xv)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, එකී පනතේ 21 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාලයක් ලෙස සලකනු ලබන ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ පීඨ සහ අධ්‍යයන අංශ නිශ්චිතව දක්වා ඇති (2014 අගෝස්තු 19 දින අංක 1876/27 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන්වරට සංශෝධිත) 1986 සැප්තැම්බර් 26 දින අංක 420/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ නියමයේ උපලේඛනය I වන තීරයේ ''කලා හා සංස්කෘතික කටයුතු පීඨය'' යන අයිතමයට අනුරූප වන්නා වූ උපලේඛනයේ II වන තීරයේ ''10. හින්දු ශිෂ්ටාචාර අංශය'' යන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

''11. දර්ශන හා ඇගයුම් අධ්‍යයන අංශය''

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 නොවැම්බර් මස 28 වැනි දින.
කොළඹ දී ය.

12 - 628